# වර්ගවාදයට එරෙහි වූ කළු ජාතිකයා

1918 ජූලි මස 18 වන දින උපත ලැබූ දකුණු අප්‍රිකාවේ මුල්ම ස්වදේශික ජනාධිපතිවරයා නෙල්සන් රොලිහ්ලාහ්ලා මැන්ඩෙලා ප්‍රජාතන්ත්‍රවාදී පූර්ණ නියෝජනය සහිත ව තේරී පත් වූ ප්‍රථම ජනාධිපතිවරයා ය. ජනතාව ගේ නොමඳ ගෞරවාදරයට පත් වූ අසහාය යුග පුරුෂයා නොබෝ දිනකින් අප අතරින් සදහටම සමුගත්තේ ය. ඔහු වර්ණ බේදවාදය තුරන් කිරීම උදෙසා ගෙනගිය අරගලය සුවහසක් ජනතාව ගේ විමුක්තිය ළඟා කළේ ය.

මැන්ඩෙලා දකුණු අප්‍රිකාවේ ජනාධිපති ධූරයට පත් වීමට පෙර වර්ගවාදයට එරෙහිව කටයුතු කළ අතර අප්‍රිකානු කොන්ග්‍රස් නායකයා මෙන් ම එහි සන්නාහ සන්නද්ධ දේශපාලනඥයකු ලෙස ද කටයුතු කළේ ය. වසර විසි හතක් රොබින්සන් දූපතේ දඬුවමක් විඳින්නට සිදු විය. සිරගත වීමට මූලික වූයේ වර්ණභේදවාදයට එරෙහිව ගෙන ගිය ව්‍යාපාරයයි. දකුණු අප්‍රිකාවේ මෙන්ම ජාත්‍යන්තර වර්ගවාදයට එරෙහි ව හඬ නැගූ මැන්ඩෙලා ස්වාධීනත්වය හා සමානාත්මතාවේ සංකේතය විය.

'මාගේ නිදහසට මඟ පාදන ද්වාරය දෙසට මම ගමන් කරන විට අම්හිරි දේවල් සහ ද්වේශය අතහැර නැත්තම් මම තවමත් සිරගතව සිටින බව දන්වා සිටිමි.' වරක් මැන්ඩෙලා ප්‍රකාශ කළේ ය. විරුද්ධවාදීන් පිළිබඳ ව අනුගමනය කළ ප්‍රතිපත්තිය මත හෙතෙම විරුද්ධවාදීන් ගේ පැසසුමට ලක්විය. අවේගශීලී අන්‍යාගමිකයන් හා සහෘදයන් සමඟ සාකච්ඡා කළ අතර තම අරමුණු කිසිවිටක පාවා නොදුන්නේ ය. ප්‍රතිපත්තිගරුක ස්වභාවය හා ව්‍යක්ත සන්නිවේදන හැකියාවෙන් සාර්ථක නායකයකු වීමට මැන්ඩෙලාට හැකි විය. සරණාගත ව ගත කළ විසිපස් වසර තුළ තමා විදි කටුක අත්දැකීම් හරහා සුදු ජාතිකයන්ට වෛර නො කළ මැන්ඩෙලා සිරගෙයි සිටියදීම එක්සත් දකුණු අප්‍රිකාවක් ගොඩනඟා විෂම සමාජ ක්‍රමය වෙනස් කිරීමට සැළසුම් සකස් කළේ ය.

ඉතිහාසය කියවා අනාගතය දෙස බැලීමට ජනතාව ගේ චින්තන ශක්තිය අවදි කිරීමට මැන්ඩෙලා ගත් උපක්‍රමය වූයේ වර්ණභේදවාදය පිළිබිඹු කෙරෙන කෞතුකාගාරයක් ජොහැන්නස්බර්ග්හි ස්ථාපිත කිරීම ය.



අවන්හලකට, කාර්යාලයකට රෝහලකට ආදී ඕනෑම පොදු හා පෞද්ගලික ස්ථානයකට පිවිසීමේදීත් සේවා ලබා ගැනීමේදීත් ජාතිය මත පදනම්ව දකුණු අප්‍රිකානුවෝ බරපතළ වෙනස්කම් රැසකට භාජනය වූහ.

'කිසිවෙකු තවත් පුද්ගලයෙකු ගේ සමෙහි වර්ණයට හෝ මනුෂ්‍ය පසුබිම හෝ ඔහු ගේ ආගම නිසා තවත් කෙනෙකුට වෛර කරමින් කිසිවෙක් ඉපදී නැත. වෛර කිරීමට මිනිසුන් ඉගෙන ගත යුතු ය. ඔවුන්ට වෛර කිරීමට ඉගෙන ගත හැකි නම් ඔවුන්ට ආදරය කිරීමට ද ඉගැන්විය හැකි ය'

මැන්ඩෙලා වෛරය හා ආදරය සංකලනයක් ලෙස හඳුන්වා නො දී වෛරය තුළින් ආදරය දැකීමට මිනිසුන්ට මඟ පෙන්වූයේ ය. ප්‍රතිපත්තිගරුක මුත් ප්‍රායෝගික නායකයකු ලෙස මැන්ඩෙලා ක්‍රියා කළේ ය. මුළු මහත් ලෝකවාසී ජනතාව ගේ ආදරයට ද සම්මානයට ද පත් වූ මැන්ඩෙලා වර්ගවාදය තුරන් කිරීමේ පුරෝගාමී පරමාදර්ශී භූමිකාව විය.




වසර හතක් පුරාවට ම සම්මාන සියයකට අධික ප්‍රමාණයකින් පිදුම් ලැබූ හෙතෙම 1993 නොබෙල් ත්‍යාගයට හිමිකම් කීවේ ය. දකුණු අප්‍රිකාවේ මැන්ඩෙලා හඳුන්වනු ලැබූයේ 'මැඩිබං' යනුවෙනි. මැන්ඩෙලා සරණාගත ව සිටියදී තම පුතු හා මව මිය ගිය හ. එකල තම බිරිඳ ගේ මුහුණ බලා ගැනීමට පවා තමන්ට ඉඩ නො ලැබුණු බව ඔහු සඳහන් කර තිබේ. එහෙත් තම පොදු අරමුණු අත් නොහළ මැන්ඩෙලා දකුණු අප්‍රිකානු රජයක් බිහි කිරීම උදෙසා කැප වූයේ ය.

මෙය තමන් ගේ ම දුක් විඳීමෙන් හා අත්දැකීම්වලින් පිබිදුණු අප්‍රිකානු ජනතා අරගලයකි. 'මම හීන දකින්නේ සියලු දෙනාට සමාන අවස්ථා ඇති සියලු දෙනාම සමඟියෙන් දිවි ගෙවන ප්‍රජාතන්ත්‍රවාදය අගයන නිදහස් සමාජයක් බිහිකිරීම උදෙසා ය. එය දිනා ගැනීමටත් ඒ මත ජීවත්වීමටත් අවශ්‍ය නම් ඒ මත්තේ මැරෙන්නටත් මම සූදානම්'

දකුණු අප්‍රිකාවේ පාපන්දු හා රග්බි ක්‍රීඩා කණ්ඩායමට පත් වීමට කලු ජාතිකයන්ට අවස්ථාව උදා කළ මැන්ඩෙලා කලු ජාතිකයන්ට ද තම රට පිළිබඳව ඇති අයිතිය ලබා දුන්නේ ය.

ළමා අයිතිවාසිකම් හා එච්. අයි. වී. අබාධිත දරුවන් වෙනුවෙන් ජාත්‍යන්තරයේ ක්‍රියාත්මක කළ සමාජ සේවා ජාලය සමස්ත ලෝකයේ ම ඇගයීමට පාත්‍ර විය. ඖෂධ සැපයීම, දුප්පත්කම, මන්දපෝෂණය වැනි සමාජ ආර්ථික සාධක සියල්ලට පිළියම් යෙදුවේ ය.

වරක් එක්සත් ජාතීන් ගේ සංවිධානයේ මහලේකම්වරයා වූ බෑං කී මූන් 'මැන්ඩෙලා යනු යුක්තිය වෙනුවෙන් කැප වූ මානව නිදහස මහ පොළොවේ රෝපණය කළ යෝධ පුරුෂයකු බව' ප්‍රකාශ කළේ ය. අමෙරිකානු ජනාධිපතිවරයා මැන්ඩෙලා අගයනු ලැබුයේ 'විශ්ව සදාචාරයේ ගමන් මාර්ගය යුක්තිය දෙසට නැඹුරු කළ පරමාදර්ශය' ලෙස ය.

'ඉන්දීය අගමැති මන්මෝහන් සිං මහා කඳු වැනි සමාජ අවහිර බිඳ හෙළමින් ස්වකීය ජනතාව විජයග්‍රහණය තෙක් මෙහෙය වූ මැන්ඩෙලා අයුක්තියට හා මර්දනයට එරෙහි ව සටන් වදින ජනතා බලාපොරොත්තුවේ ගිනිසිළුව යැයි ප්‍රකාශ කළේ ය.'

බ්‍රිතාන්‍ය අගමැතිවරයා වූ ඩේවිඩ් කැමරන් 'අපේ කාලයේ උත්තුංග නායකයා' ලෙස මැන්ඩෙලා නම් කළේ ය. ජාතික ඒකාග්‍රතාව, ජාතීන් අතර සංහිඳියාව සමඟිය ආදී උතුම් සංකල්ප පිළිබඳ රටවැසියා අමතා කතා කිරීමේ ව්‍යක්ත ශක්‍යතාව ඔහු සතු විය.

දිළිඳු රටවල සෞඛ්‍ය තත්ත්වය, අධ්‍යාපන තත්ත්වය විමර්ශනය කළ මැන්ඩෙලා 'ලෝකය වෙනස් කළ බලගතු අවිය අධ්‍යාපනය යැ'යි ප්‍රකාශ කළේ ය. සාහිත්‍ය කලාව අගය කළ මැන්ඩෙලා 'ඕනෑම දරුණු සිතක් සුව කිරීමට සාහිත්‍යයට හැකි බව' පැවසුවේ ය.

මැන්ඩෙලා වර්ගවාදය කෙළවර කර සුවහසක් පීඩිත ජනයා වෙනුවෙන් තම ජීවිතය ම කැප කළේ ය. 'දකුණු අප්‍රිකාවේ අහිංසාවාදයේ පියා' යන විරුදාවලියෙන් පිදුම් ලද මැන්ඩෙලා වසර කිහිපයක් පෙනහලු පිළිකාවෙන් පීඩා විඳ 95 වියේදී අභාවප්‍රාප්ත වූ අතර, ඔහු ගේ අන්තිම කැමති පත්‍රයෙන් පවා පරමාදර්ශී ප්‍රායෝගික පුද්ගලයකු බවට හෙතෙම පත් විය. ජූලි 18 යෙදෙන මැන්ඩෙලා දිනය ලෝක වාසී ජනතාව විශේෂයෙන් දකුණු අප්‍රිකානු කළු ජාතිකයන්ට විමුක්තිය ළඟා කර දුන් ආදරණීය නායකයා ගේ දිනය වනු ඇත. ලෝක වාසී පීඩිත ජනතාව උදෙසා ඔහු කළ සේවය අගයනු වස් මේ විශිෂ්ට පුද්ගලයා වෙනුවෙන් 'චමත්කාර' සඟරාවේ මංගල කලාපයේ අපේ උපහාරය පුදකර සිටින්නෙමු. ■

**එච්. කේ. එම්. ඒ. ආර්. බණ්ඩාර**

